ඇමුණුම 02

## අයදුම්කරුවන් සඳහා අමතර උපදෙස්

**01.** ඇමුණුම 01 හි 02 හි සඳහන් අයදුම්කරුවන් සඳහා උපදෙස් හා අමතර උපදෙස් හොඳින් කියවා තේරුම් ගන්න.

**02.** එමෙන්ම 2025.11.07 දිනැති අංක 2,462 දරණ ගැසට් නිවේදනයේ සඳහන් උපදෙස් හොඳින් කියවා තේරුම් ගන්න.

**03.** ඒ අනුව ශාරීරික අධ්‍යාපන පාඨමාලාවට අදාළ සියලුම සුදුසුකම් සපුරා ඇත්නම් මේ සමඟ යොමු කර ඇති ඇමුණුම් අංක 03 හි සඳහන් සම්මුඛ පරීක්ෂණ ලේඛනය හොඳින් කියවා ඔබට අදාළ සම්මුඛ පරීක්ෂණ දිනය හා වේලාව, මණ්ඩල අංකය, කැඳවීම් අංකය (යොමු අංකය), පරිගණක අංකය, මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ මණ්ඩල අංකය (E.A.B.) හඳුනා ගන්න.

**04.** ඇමුණුම 04 හි සඳහන් කැඳවීමේ ලිපියෙහි පිටපතක් එකම කොළයෙහි දෙපැත්තට මුද්‍රණය කර, ඉහත සඳහන් තොරතුරු එහි සටහන්කර කැඳවීම් ලිපියේ මුල් පිටුව සම්පූර්ණ කර ගන්න.

**05.** ඇමුණුම් අංක 05 හි ඇති ජීවදත්ත ප්‍රකාශයෙහි පිටපතක් ගෙන සම්පූර්ණ කරන්න.

**06.** ඇමුණුම් අංක 06 හි ඇති (ගැසට් නිවේදනයේ 8.1, 8.2, 8.3, 8.4, 8.5 සහ 8.6 ට අදාළ ) දිවුරුම් ප්‍රකාශයෙහි පිටපතක් ගෙන සාමදාන විනිශ්චයකාරයකු ඉදිරිපිට අත්සන් කරවා ගෙන පැමිණෙන්න.

**07.** ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් එකක් හෝ ඔබ සම්පූර්ණ කර නොමැතිනම් සම්මුඛ පරීක්ෂණයට පැමිණීම නිශ්ඵල ක්‍රියාවක් බැවින්, ඇමුණුම් අංක 07 හි සඳහන් ලිපියෙහි පිටපතක් ගෙන ඔබ සම්මුඛ පරීක්ෂණයට නොපැමිනෙන්නේ නම් ඒ බව දන්වන්න.

**08. 2025.11.07** දිනැති ගැසට් නිවේදනයේ සඳහන් ඔබ ඉල්ලුම් කළ පාඨමාලාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන සහතික රැගෙන ආ යුතුය.

- i. අ.පො.ස. (සා.පෙළ.) සහතික
- ii. 2023, 2024 අ.පො.ස. (උ.පෙළ.) සහතික
- iii. මෙම වසර දෙකට පෙර ඔබ අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිට ඇත්නම් එම සහතික ද රැගෙන ආ යුතුය.

**12.** අධ්‍යාපන සහතිකවලට අමතරව පහත සඳහන් ලේඛන රැගෙන ආ යුතුය.

- i. ජාතික හැඳුනුම්පත
- ii. උප්පැන්න සහතිකය ("නොමිලේ නිකුත් කරන ලදී" යන්න සඳහන් සහතික වලංගු නොවන බැවින් නව පිටපතක් රැගෙන ආ යුතුය.)
- iii. පාසල හැරයාමේ සහතිකය
- iv. පාසලෙන් ලබා ගත් චරිත සහතිකය
- v. ග්‍රාම නිලධාරි සහතිකය
- vi. ක්‍රීඩා සහතික

❖ පිළිගත් ජවන හා පිටිය, මලල ක්‍රීඩා, සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රවීනතාවක් / දක්ෂතාවක් ලබා තිබීම. මේ යටතේ විවිධ ඉසව් 03ක් සඳහා ඉදිරිපත් කරන සහතික 03ක් සලකා බලා ලකුණු ප්‍රදානය කෙරෙන බැවින් සම්මුඛ පරීක්ෂණ දිනයේ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

❖ ලකුණු හිමිවනුයේ එක් ඉසව්වකදී එකම වසරක ලබා ගත් ඉහළම සහතිකයට පමණි.

❖ 2023 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත අයදුම් කරනු ලබන්නන් සඳහා 2019.01.01 දින සිට 2023.12.31 දින දක්වා ලබා ගත් ක්‍රීඩා සහතික වලංගු වේ.

CamScanner

- 2024 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත අයදුම් කරනු ලබන්නන් සඳහා 2020.01.01 දින සිට 2024.12.31 දින දක්වා ලබා ගත් ක්‍රීඩා ජයග්‍රහණ සහතික වලංගු වේ.

- මෙම කාලසීමාවට පෙර හා පසුව නිකුත් කළ සහතිකපත් ලකුණු ලබා දීම සඳහා සලකා බලනු නොලැබේ.

- එම කාලසීමාවට අයත් අයදුම්කරුවන්ගේ උපරිම දක්ෂතා දක්වා ඇති ක්‍රීඩා ජයග්‍රහණ සහතිකපත් 03කට පමණක් ලකුණු ප්‍රදානය කරන අතර සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සියලුම සහතිකපත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

- ඔබගේ ක්‍රීඩා සහතික 03ට අදාළ මුළු ලකුණු 10 හෝ ඊට අඩු නම් අදාළ ගැසට් නිවේදනයට අනුව තෝරා ගැනීම සඳහා සුදුසුකමක් නොවන බව දන්වමි.

- ඔබේ ලකුණු 10 හෝ ඊට අඩු නම් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම නිෂ්ඵල ක්‍රියාවක් බැවින්, ඔබ සම්මුඛ පරීක්ෂණයට නොපැමිණෙන්නේ නම් ඒ බව මේ සමඟ ඇති ලිපිය මඟින් දැක්විය යුතු වේ. එම ලිපිය ඔබ ඇතුළත් කර සකසා ඇති වට්ස්ඇප් සමූහයට ද යොමු කරන ලෙස දන්වමි.

- ඔබේ සහතිකපත්වලට හිමි ලකුණු 2025.11.07 දිනැති ගැසට් නිවේදනයේ 4.19.3.1 ක්‍රීඩා/ ඇසවව/ ප්‍රමුඛතා අනුපිළිවෙල වගුවේ දක්වා ඇත.

- ගැසට් නිවේදනයේ මෘදු පිටපතක් ද ඔබගේ වට්ස්ඇප් සමූහයට යොමු කරනු ඇත.

> ගැසට් නිවේදනයේ 10.10 ට අනුව අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතික කූට හෝ වංචනික හෝ බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු පාඨමාලාවෙන් / සේවයෙන් පහ කරනු ලබන අතර ඉන් ඉදිරියට රාජ්‍ය සේවයේ කිසිදු පත්වීමක් සඳහා නුසුදුස්සකු වනු ඇත.එබැවින්, කූට ලේඛන ඉදිරිපත් නොකරන ලෙස දන්වා සිටිමි.

13. තම සහතිකවලට අදාළ ක්‍රීඩා ලකුණු 10ට වැඩි සියලුම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටීම අනිවාර්ය බැවින් වෛද්‍ය වාර්තාවක් රැගෙන ඒම අනිවාර්ය වේ.
    - කිසිදු හේතුවක් මත වෛද්‍ය වාර්තාවක් නොමැතිව ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය නොහැකි අතර, එසේ වුවහොත් ඔහු/ඇය පාඨමාලාවට තෝරා ගැනීමට නුසුදුස්සකු වේ.
    - එමෙන්ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට උචිත ඇඳුමක් රැගෙන ඒම ද අනිවාර්ය වේ.

14. සම්මුඛ පරීක්ෂණයට හා ප්‍රායෝගික පරීක්ෂණයට අමතරව පෞරුෂ පරීක්ෂණයක් ද සිදු කරනු ලබන අතර එහිදී අයදුම්කරුගේ බාහිර පෙනුම, ආචාරශීලී බව, කථන හැකියාව හා ඉදිරිපත් කිරීමේ හැකියාව, කලු ලෑල්ල භාවිතය හා භාෂා ශෛලිය පිළිබඳව අවධානය යොමු කරන බවද දන්වා සිටිමි.

15. ගුරුවරයෙකුට උචිත සාරියක් හෝ ඔසරියක් (කාන්තා), අත් දිග කමිසය හා කලිසම (පිරිමි) ඇඳුමකින් සැරසී නියමිත දින, නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණයට පැමිණිය යුතුවේ.

16. හැඳුනුම්පත හා සියලුම සහතිකවල මුල් පිටපත් සහ ඡායා පිටපත් වෙන වෙනම ගොනු දෙකක බහා රැගෙන ආ යුතු අතර, සියලුම ඡායා පිටපත්වල අයදුම්කරු විසින්ම ඒවා සත්‍ය පිටපත් බව සහතික කළ යුතුය.

17. මැතිවරණ උද්ධෘත පරීක්ෂා කිරීමේ මණ්ඩලය හරහා ඔබේ පදිංචිය පරීක්ෂා කරන බැවින් මවගේ සහ පියාගේ හෝ භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංක ද රැගෙන ආ යුතුය.

CamScanner

18. 2025.01.01 දිනට වයස අවුරුදු 25 ඉක්මවා ඇති අයදුම්කරුවන් බඳවා ගැනීමට සුදුසුකම් නොලබන බැවින් 2000.01.01ට පෙර උපත ලබා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට පැමිණීම නිෂ්ඵල කාර්යයකි.
(ගැසට් නිවේදනයේ 2.3.1 බලන්න)

- ❖ ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් සුදුසුකම්ද සපුරා ඇත්නම් 2000.01.01 හා ඉන් පසුව උපත ලද අය සම්මුඛ පරීක්ෂණයට පැමිණිය හැක.
අදාළ වයස ඉක්මවා ඇති අය ඒ බව ලිඛිතව වට්ස්ඇප් සමූහයට දන්වන්න.

19. එමෙන්ම ගැසට් නිවේදනයට අනුව අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති අය වෙතොත් ඒ බව ලිඛිතව දන්වා එවීමට කාරුණික වන්න.

එය පහත ලිපිනයට එවන්න.
පීඨාධිපති,
ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය,
බිඳුණුවැව,
බණ්ඩාරවෙල.

- ❖ එමෙන්ම නොපැමිණෙන බව සඳහන් ලිපිය වට්ස්ඇප් සමූහයටද යොමු කරන්න.

27/03/2026.
...............................................
පීඨාධිපති

කාන්ති බුලේගොඩ ආරච්චිගේ
පීඨාධිපති
ශ්‍රී.ලං.ගු.අ.සේ. I
ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
බිඳුණුවැව, බණ්ඩාරවෙල.

CamScanner